2017 ජුනි මස 1 වනදා

**ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා වෙත කරන ඉල්ලීමක් : ඉතා ඉක්මනින් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය පිහිටුවන්න.**

සැළකිය යුතු තරම් වන පුරවැසියන් සංඛ්‍යාවක් වෙත ඔවුන්ගේ අතුරුදහන් වූ හා සොයාගැනීමට නොහැකි ආදරණීයයන් පිළිබඳව සොයා බලන බවට වූ ප්‍රධාන පොරොන්දු ඉටුකිරීමේදී ශ්‍රී ලාංකීය රජය දක්වන අක්‍රීය භාවය පිළිබඳව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය (CPA) තම දැඩි කනස්සල්ල පළ කොට සිටී. වින්දිතයන් විසින් සිදුකරනු ලැබූ අඛණ්ඩ විරෝධතාවය ඇතුළුව රජයට තම පොරොන්දු ඉටුකරන ලෙස කරන ලද ඉල්ලීම් ගණනාවක් තිබියදී ඔවුන්ගේ එම සියලු ඉල්ලීම් නොසළකා හරිනු ලැබ තිබේ. අතුරුදහන්වූවන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයක් පිහිටුවන බවට හා බලහත්කාරයෙන් අතුරුදහන් කරවීම සාපරාධී වරදක් බවට පත්කරන බවට 2015 දී දෙන ලද මහේච්ඡ පොරොන්දු තවමත් ඉටුවී නොමැත.

බලහත්කාරයෙන් අතුරුදහන් කරවීම් සහ සොයාගැනීමට නොහැකි පුද්ලගලයන් පිළිබඳව සොයා බැලීම සඳහා වූ පලමු ස්ථාවර සහ ස්වාධීන යාන්ත්‍රනය පිහිටුවීම පිළිබඳව වූ නීතිකරණයන් පාර්ලිමේන්තුව විසින් පනවන ලද්දේ 2016 අගෝස්තු මස දීය. කෙටුම්පත් කිරීමේ ක්‍රියාදාමයෙහිදී යම් අඩුපාඩු සිදුවී තිබුණු නමුදු විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් මෙම නීතිකරණය සතුටින් පිළිගනු ලැබුයේ එමගින් අතිතයේ සිදු වූ වැරදි මගහරවා ගැනීමට හා වින්දිතයන් හට යම් පිළිතුරක් සැපයීමට අව්‍යාජ අවස්ථාවක් සැපයුනු හෙයිනි. නීති සම්මත කිරීමෙන් මාස නවයක් ගතවී ඇති මේ අවස්ථාවෙහිදී ද අතුරුදහන්වූවන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය තවත් මායාකාරී යාන්ත්‍රණයක් පමණක් බවට පත්වී තිබීම පිළිබඳව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සිය කලකිරීම හා කනස්සල්ල පලකර සිටී. තවදුරටත් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ දැඩි සැලකිල්ල යොමුවී ඇති කාරණයක් වන්නේ අතුරුදහන්වූවන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය පිහිටුවීම පසෙක තිබියදී එම කාර්යාලයේ නිල පැවරුම සාක්ෂාත් කර ගැනීමට අවශ්‍යවන්නාවූ ගිවිසුම් වලට එළඹීමට එයට ඇති හැකියාව හීනකරවන නීතිකරණ කෙටුම්පත් හඳුන්වා දීමට රජය කටයුතුකර තිබිමයි. ස්වාධින සහ ඵලදායක ආයතනයක් ලෙස අතුරුදහන්වූවන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල ක්‍රියාත්මකවීම අවහිර කිරීමේ හැකියාවක් මෙම සංශෝධනයෙහි පවතී. අතුරුදහන්වූවන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය සංශෝධන කෙටුම්පත් පනත (අතුරුදහන්වූවන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය සහ කර්තව්‍ය ඉටුකිරීම) (සංශෝධන පනත් කෙටුම්පත) 2017 ජුනි 7 වන දා පාර්ලිමේන්තුවේදි විවාදයට ගැනීම පිණිස දැනට ලැයිස්තු ගත කර ඇති බව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයට දැනගන්නට ලැබී ඇත. මෙම සන්දර්භය තුල විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය තමන් පෙර දී කල ඉල්ලීම් දැඩිලෙස අවධාරණය කර සිටින අතර තම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය වගකීම් ඉටු කරමින් අතුරුදහන්වූවන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය ස්ථාපිත කිරීමට කටයුතු කරන ලෙස ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතාගෙන් දැඩිලෙස ඉල්ලා සිටී. එමෙන්ම අතුරුදහන්වූවන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට ස්වාධීන හා පළපුරුදු පුද්ගලයන් පත්කිරීමට ද එම කාර්යාලය ඵලදායක ලෙස ක්‍රියාත්මක වීමට අවශ්‍ය සම්පත් සහ සහාය ලබාදීමටද ක්‍රියාකල යුතුව ඇත. මෙම නීතිකරණය වෙත වන කුමන හෝ සංශෝධනයක් කරනු ලැබිය යුත්තේ සද්භාවයෙන් යුතුව හා අතුරුදහන්වූවන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල පිහිටුවීමේ අරමුණ දුර්වල නොවන පරිද්දෙනි.

බලහත්කාරයෙන් අතුරුදහන් කරවීම සහ සොයාගත නොහැකි පුද්ගලයන් යනු දශක කිහිපයක් තිස්සේ ශ්‍රී ලංකාවට ව්‍යාධියක්ව පවතින ප්‍රශ්ණයක් වේ. කලින් කල බලයට පැමිණි රජයයන් විසින් මේවා පිළිබඳව කොමිෂන් සභාවන් සහ කමිටු ගණනාවක් පත්කර ඇති නමුදු ඒවා පිළිබඳව අනුගමනීය ක්‍රියාමාර්ගයන් ගනුලැබ ඇත්තේ ඉතා ස්වල්ප වශයෙන් හෝ ඇත්තේම නැති තරමිනි. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් වින්දිතයන්හට සත්‍ය හා සාධාරණය ඉටුකිරීමට අසමත්වූ අඩුපාඩු සහිත වූ රාජ්‍ය උත්සාහයන් ගණනාවක් පිළිබඳව <u>තම විවේචනයන් ඉදිරිපත් කොට ඇත.</u> එබඳු බොහෝ උත්සාහයන්ගෙන් සිදුවුයේ වින්දිතයන් නැවත කම්පාවට පත්කිරීම හා ඔවුනට බොරු බලාපොරොත්තු දීම පමණි. ප්‍රායෝගික වශයෙන් ගත්කල එවැනි උත්සාහයන් වින්දිතයන්ගේ අභිමානය හාස්‍යයට ලක්කල අතර එහිදී සිදුවූ ප්‍රමාදයන් හා අක්‍රීය බව මගින් දඬුවම් නොලබා වරද කිරීමේ සංස්කෘතිය වඩාත් උග්‍ර කෙරිනි. ජනාධිපති සිරිසේන මහතා විසින් මෑතකදී කල ප්‍රකාශයන් මගින් අඟවනු ලැබ ඇති පරිදි මෙම විෂයය පිළිබඳව වූ තවත් කමිටුවක් පත්කරන්නේ නම්, එම පත්කිරීම වරදක් වන බවට මෙකී සිදුවීම් මඟින් සිහිපත් කෙරේ.

විධායක ජනාධිපතිවරයා යනු තම සහෝදර පුරවැසියන් දහස් ගනනකගේ ආදරනීයයන් අතුරුදහන් වීම් පිළිබඳව පිලිතුරු සෝයාගැනීමට සහයවන්නෙක් නොව සැලැසුම් සහගතව හෝ අතපසු වීමෙන් ඒවා පිළිබඳව නිෂ්ශබදතාවය සහ දණ්ඩන මුක්තිය දිගින් දිගටම පවත්වාගෙන යමින් තමන් අතර වූ ගැඹුරු බෙදීම් හා අවිශ්වාසය පෝෂණය කිරීමට නැඹුරු වුවකු යැයි පවතින හැඟීම වඩාත් උග්‍රකරවීමක් එමගින් සිදුවනු ඇත.

රාජ්‍ය  සහ රාජ්‍ය නොවන ක්‍රියාකාරි කොටස් විසින් දශක ගණනක් තිස්සේ සිදු කළ වැරදි මගින් ශ්‍රී ලංකාව පුරා වාසය කරන පුරවැසියන් හට දැඩි බලපෑමක් සිදුකර ඇති අතර ප්‍රචණ්ඩත්වයේ උරුමයකටද ඒවා දායක වී ඇත. සත්‍යය, සාධාරණය සහ සමගි සන්ධානය සදහා වූ ප්‍රතිසංස්කරණයන් ගෙන ඒම සදහා වන මෙම සුවිශේෂ ඉඩප්‍රස්ථාව රජය විසින් නාස්තිකරන තෙක් බලාසිටින විවේචකයන්ගේ දෑත්, අක්‍රීය ලෙස සිටිම සහ උවමනාවක් නැතිකම මගින් ශක්තිමත් කෙරෙනු ඇත. යුද්ධය අවසන් වී වසර අටකට වැඩි කාලයක්ද "*යහපාලන රජය*" බිහි වී වසර දෙකකට වැඩි කාලයක් ද ගත වී ඇත. රජය විසින් දුන් ඉතාම තීරණාත්මක පොරොන්දු සමහරක් ඉටුකිරීම පිණිස කාලය ඉතාමත් වැදගත් සාධකයක්ව පවතී. ජනාධිපති සිරිසේන මහතා දැන් ක්‍රියාත්මක විය යුතුය!

අතුරුදහන්වුවන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය සහ ඒ හා ආශීතකරුණු පිළිබදව වු විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ පෙර ප්‍රකාශයන් හා ලියකියවිලි ලබාගැනීම පිණිස www.cpalanka.org සහ www.tjsrilanka.org යන වෙබ් අඩවි වෙත පිවිසෙන්න.